CENTRE FOR POLICY ALTERNATIVES
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
மாற்றுக் கொள்கைகளுக்கான நிலையம்

# මේජර් ජනරාල් ශවේන්ද්‍ර සිල්වා මහතා ශ්‍රී ලංකා යුද හමුදාවේ හමුදාපති තනතුරට පත් කිරීම සම්බන්ධයෙන් වන කනස්සල්ල දනවන තත්ත්වයන් සහ හදිසි ප්‍රතිසංස්කරණයන්ගේ අවශ්‍යතාවය

***2019 අගෝස්තු 19 වැනිදා, කොළඹ, ශ්‍රී ලංකාව***: ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා විසින් මේජර් ජනරාල් ශවේන්ද්‍ර සිල්වා මහතා ශ්‍රී ලංකාවේ යුද හමුදාපති වශයෙන් පත්කිරීම පිළිබඳව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සිය දැඩි සැලකිලිමත්භාවය පලකොට සිටී. මේජර් ජනරාල් සිල්වා මහතාට එරෙහිව එල්ල වී ඇති බරපතල චෝදනා සැළකිල්ලට ගෙන මෙම පත්වීම නැවත සළකා බැලීමට වහාම පියවර ගන්නා ලෙස අපි රජයෙන් දැඩිලෙස ඉල්ලා සිටින්නෙමු.

මේ වසරේ ජනවාරි මාසයේදී මේජර් ජනරල් සිල්වා මහතා ශ්‍රී ලංකා යුද හමුදාවේ කාර්ය මණ්ඩල ප්‍රධානී තනතුරට පත්කරනු ලැබූ විට ද ඒ පිළිබඳව මෙහා සමාන සැලකිලිමත්විය යුතු කරුණු විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් ඉස්මතු තරන ලදි. ආරක්ෂක අංශයේ ප්‍රතිසංස්කරණ සහ වගවීම උදෙසා කැපවුනු වර්තමාන රජය විසින් මෙම සැලකිලිමත් විය යුතු කරුණු සම්බන්ධයෙන් කටයුතු කිරීමට කිසිඳු පියවරක් නොගැනීම පිළිබඳව අප දැඩි බලාපොරොත්තු සුන්වීමටකට පත්ව සිටිමු. අද සිදු කරනු ලැබූ පත්වීම සැබැවින්ම ඒ පොරොන්දුවූ ප්‍රතිසංස්කරණයන් ප්‍රතික්ෂේප කිරීමක් ය.

මානව හිමිකම් සම්මතයන් පැහැදිලි ලෙසම නොසලකා හැරීමක් එයින් ප්‍රදර්ශනය වන අතර එමගින් ශ්‍රී ලංකාවේ දණ්ඩන මුක්තිය ද තවදුරටත් ශක්තිමත් කෙරේ. මේජර් ජනරාල් සිල්වා මහතා යුද්ධයේ අවසාන අවධියෙ හිදී ශ්‍රී ලංකා යුද හමුදාවේ 58 වන සේනාංකයේ අණදෙන නිලධාරියා විය. ප්‍රසිද්ධ ලියවිලි ගණනාවක් මගින්ම ජාත්‍යන්තර මානුෂවාදී නීතිය හා ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය උල්ලංඝණය කිරීම් පිළිබඳව ඔහු වෙත චෝදනාවන් එල්ල කරනු ලැබ ඇත.

මේ ඒවායින් සමහරකි:

- 2011 වසරේහිදී එක්සත් ජාතීන්ගේ විශේෂඥ කණ්ඩායමක් විසින් තම වාර්තාවෙහි මේජර් ජනරාල් සිල්වා මහතා නම් කොට තිබුණු අතර එහි යුද්ධය පැවති කාලය තුලදී සිදුවූ උල්ලංඝණයන් පිළිබඳව වැඩිදුරටත් ස්වාධීන විමර්ශන පැවැත්වීම සඳහා වූ නිර්දේශක් ඇතුලත්කර තිබිනි.

- 2012 වසරෙහිදී මානව හිමිකම් පිළිබඳව වූ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස්වරයා විසින් එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයට (UNHCR) දැනුම්දී සිටියේ "අතිශයින්ම අවම වශයෙන් වත් සිල්වා මහතා විසින් පිලිතුරු දිය යුතුව ඇති ජාත්‍යන්තර අපරාධ නඩුවක සලකුණු දර්ශනයවීමක් ඇති බවය.

- නැවත 2012 වසරෙහිදී, යුද්ධයේ අවසන් අවධියේදී සිල්වා මහතාගේ ක්‍රියාකලාපය වෙත එල්ල වූ චෝදනාවන් හේතුකොට ගෙන සාම සාධක ක්‍රියාන්විතයන් පිළිබඳව වූ එක්සත් ජාතීන්ගේ විශේෂ උපදේශක කණ්ඩායමෙන් ඔහුව ඉවත් කරන ලදී.

- 2015 දී එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳව කාර්යාලය විසින් ශ්‍රී ලංකාව පිළිබඳ සිදුකල පරීක්ෂණයේ වාර්තාව මගින් සිල්වා මහතා සහ 58වන සේනාංකය හා සම්බන්ධ යුද අපරාධ සේ සැලකෙන උල්ලංඝණයන් ගණනාවක්ම ලේඛන ගත කොට ඇත. කිලිනොච්චි, පුදුකුඩිඉරුප්පු,

පුදුමාතලන්, මුල්ලිවයික්කාල් සහ තවත් ප්‍රදේශවල සිවිල් ජනගහනයන් වෙත චේතනාන්විතව සහ නිර්විශේෂිතව තොරව එල්ල කරන ලද මහා පරිමාණයෙන් සිවිල් වැසියන්ට හා සිවිල් දේපල වලට මරණ හා අලාභහානි ඇති වූ ප්‍රහාරයන් මීට ඇතුලත් වෙයි. සාක්ෂි මගින් පෙන්වා දෙන්නේ රෝහල්, යුද මුක්ත කළාප, එක්සත් ජාතීන්ගේ පරිශ්‍රයන් සහ විශේෂයෙන් කාන්තාවන් ළමුන් සහ වයස්ගත වූවන් ඇතුලත් වන සිවිල් වැසියන් සිටි ස්ථානයන් වෙත ප්‍රහාරයන් එල්ල වූ බවය. මෙම වාර්තාවෙන්, මහත් ප්‍රසිද්ධියට පත් ''සුදු කොඩි'' සිදුවීම ඇතුළුව භාර වූවන්ගේ පිළිබඳව වූ පිරික්සුමට ලක් වේ.

- 2015 වසරේම, එවකට ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා විසින් පත්කරණු ලැබූ පරණගම කොමිසම ද ''සුදු කොඩි'' භාර වීම් ද සහ වෙනත් සිදුවීම් සඳහන් කළ අතර විශ්වාස කළ හැකි යුද අපරාධ චෝදනාවන් ස්වාධීන විමර්ශණ ඇති බැවින් පැවැතිය යුතු බවද සඳහන් කෙරිනි.

- 2019 මාර්තු මසදී එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මහ කොමසාරිස්වරයාගේ වාර්තාවෙහි මේජර් ජනරාල් ශවේන්ද්‍ර සිල්වා මහතා ශ්‍රී ලංකා යුද හමුදාවේ කාර්යමණ්ඩල ප්‍රධනී තනතුරට පත් කරනු ලැබීම පිළිබඳව සැලැකිලිමත් විය යුතු කරුණු මතු කොට තිබුණු අතර එයට හේතු වූයේ ඔහු අණදුන් භට හමුදාවන් විසින් මානව හිමිකම් උල්ලංඝණය කිරීම් පිළිබඳ ලේඛන ගත වූ චෝදනාය.

ඉහත සඳහන් වන්නේ මේජර් ජ්නරාල් සිල්වා මහතාට එරෙහිව එල්ලකරණු ලැබ ඇති බරපතළ චෝදනාවන් පිළිබඳව වූ දර්ශණ මාත්‍රයකි. මෙම චෝදනාවන් මෙතරම් බරපතළ ව තිබියදීත් පැවැති රජය හෝ වත්මන් රජය විසින් ඒවා නිසි පරීක්ෂණයකට ලක්කරනු ලැබ නොමැත. සැබැවින්ම මේජර් ජනරාල් සිල්වා මහතාට ලැබුණු උසස්වීම් ගණනාවෙන් විසින් පෙන්වා දෙන්නේ ඒවා මෙම චෝදිත උල්ලංඝයන් සඳහා ඔහුට දුන් පිරිනැවීමක් බවයි. මෙය මෙසේ සිදුවන්නේ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ යෝජනා 30 සම්මුතියේ කොටසක් වූ ලෙස ආරක්ෂක අංශයෙහි ප්‍රතිසංස්කරණ සහ වගවීම් පිළිබඳව රජය විසින්ම දෙනු ලැබූ පොරොන්දු ද පවතින පසුබිමකදීය.

යුද්ධය අවසන් වී දසවසකට පසුව පාස්කු ඉරිදා ප්‍රහාරයන් මඟින් උද්ගතව ඇති නව ආරක්ෂක අභියෝගයන් මඟින් මෙම අර්බුධයන් තවදුරටත් සංකීරණ කෙරේ වේ. 2019 අප්‍රේල් 21 වැනි දා සිදු වූ මෙම ප්‍රහාරයන් පිළිබඳව සොයා බැලීමට පත් කරණු ලැබූ පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවේ දැනට පැවැත්වෙමින් ඇති සැසි වාරයන් මඟින් ද පෙන්වා දෙන්නේ ආරක්ෂක හා බුද්ධි අංශයන් හී හදිසි ප්‍රතිසංස්කරණයන්ගේ අවශ්‍යතාවය යි. මෙසේ බරපතළ චෝදනාවන් පවතිද්දී මේජර් ජනරාල් සිල්වා මහතා ශ්‍රී ලංකා යුධ හමුදාවේ ජ්‍යෙෂ්ඨතම නිලයට පත්කරණු ලැබීමෙන් අවශ්‍යව ඇති ප්‍රතිසංස්කරණයන් සහ දන්ඩන මුක්තිය නම් වූ ගැටළුව සම්බන්ධයෙන් කටයුතු දියත් කිරීමට රජයේ ඇති කැපවීම ගැන මහජන විශ්වාසයක් ඇති වීමේ හැකියාවක් නොමැත.

මෙම සන්දර්භය තුල, වත්මන් පත් වීම පිළිබඳ නැවත සලකා බලන ලෙස විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය රජයෙන් දැඩි ලෙස ඉල්ලා සිටී. එමෙන්ම පාර්ලිමේන්තුවේ අදාල ආංශික අධීක්ෂණ කමිටුවලින්ද අප ඉල්ලා සිටින්නේ මේජර් ජනරාල් සිල්වා මහතා සහ යුද හමුදාව වඩා ශක්තිමත් ලෙස නිරීක්ෂණය කිරීමේ නියැලීමට හා මානව හිමිකම් උල්ලංඝණය කිරීම් නොතකා හැරෙන හා දන්ඩන මුක්තිය තර කරවන තත්ත්වයක්කරා ශ්‍රී ලංකාව දිගින් දිගටම තල්ලුවී යාම වැලැක්වීමට ක්‍රියාමාර්ග ගන්නා ලෙසය.